## ඇටර්නි බලය අවලංගු කිරීම

කඳාන, හපුගොඩ, ජයසූරිය මාවතේ, අංක 30/බී, දරන ස්ථානයේ පදිංචි දිසානායක මුදලිගේ රෝහණ දිසානායක වන මම, කඳාන, යූ. නිහාල් පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2004.01.12 වන දින ලියා සහතික කරන ලද අංක 935 දරන ඇටර්නි බලපත්‍රය මඟින් මා වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දී සියලු කටයුතු ඉටු කිරීම සඳහා කඳාන, හපුගොඩ, ජයසූරිය මාවතේ, අංක 30/බී හි පදිංචි චන්ද්‍රසේකර පවුලස්ගේ දමයන්ති සාධනා (රෝහණ දිසානායකගේ බිරිඳ) යන අය මාගේ නියම හා නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස පත් කරන ලදී. එම ඇටර්නි බලකරුට මා විසින් පැවරූ ඇටර්නි බලය මෙයින් මා අවලංගු කරන බවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවටත්, මෙයින් දන්වා සිටිමි.

තවද, එකී චන්ද්‍රසේකර පවුලස්ගේ දමයන්ති සාධනාට (රෝහණ දිසානායකගේ බිරිඳට) ඇටර්නි බලපත්‍රයේ වලංගු භාවයක් හෝ නීත්‍යානුකූල පැවැත්මක් මා වෙනුවෙන් දී ඇති බලය සම්බන්ධයෙන් නොමැති බවත්, මා වෙනුවෙන් කරනු ලබන හෝ කරවනු ලබන ඕනෑම ක්‍රියාවක් හෝ දෙයක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් දරන්නේ නැති බවත් මෙයින් දැනුම් දෙමි.

දිසානායක මුදලිගේ රෝහණ දිසානායක.

අංක 30/බී, ජයසූරිය මාවත,
හපුගොඩ, කඳාන.
2007 අගෝස්තු මස 20 වැනි දින.

09-24

## සමාගමක් ලියාපදිංචි කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ අංක 09 (01) වගන්තිය ප්‍රකාර ලියාපදිංචි කරන ලදී.

නම :- හිල්සන් මාර්කටින් සර්විස් පුද්ගලික සමාගම
ලියාපදිංචි අංකය :- PV 60209
දිනය :- 2007.06.08
ලිපිනය :- එච්. ඒ. ධර්මසේන, 13/2, පිළපිටිය, කිරිබත්කුඹුර.

අධ්‍යක්ෂ. ලේකම්.

09-17

---

## සමාගමක් සංස්ථාපනය කිරීමේ දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි :

සමාගමේ නම : මොඩියුලර් බිල්ඩිං සොලුෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සංස්ථාගත කිරීමේ දිනය : 2007.07.31
ලියාපදිංචි කාර්යාලය : අංක 80, සණස අයිඩියල් කම්පෙල්ක්ස්, කොළඹ පාර, ගම්පහ
සංස්ථාගත අංකය : පී වී 60847.

සී අයි බී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(ලේකම්වරු)

2007 අගෝස්තු මස 20 වැනි දින

09-10

---

## ඔලිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අගෝස්තු 14 වන දිනදී සමාගම ලියාපදිංචි අංක පීවී 61017 යටතේ ඔලිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ කාර්යාලයීය ලිපිනය නාවල, කොස්වත්ත රත්නජෝති මාවත, අංක 45 දරන ස්ථානයෙහි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

ඊඑම් ඇන්ඩ් ඊඑන් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගම් ලේකම්වරු).

එම්. ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

09-05

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර පහත දැක්වෙන සමාගම ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි :

සමාගමේ නම : ඉන්ට්‍රැවල් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 60786
ලියාපදිංචි ලිපිනය : අංක 85/27, ජාවත්ත උද්‍යානය, ජාවත්ත පාර, කොළඹ 05.

හිරාන් ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ.

09-04

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරුණු ලබන නිවේදනයයි.

පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.:

සමාගමේ නම : සීමාසහිත ඉනොබිට් (පුද්ගලික) සමාගම
අංකය : පීවී 60671
දානම : 2007.07.16
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 221/4, කොටා පාර, කොළඹ 08.

09-127

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

සමාගමේ නාමය : ජෝන්කේ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 60908
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40 ඒ, 3 වැනි පටුමග, කොරළවැල්ල, මොරටුව

සමාගමේ ලේකම්.

09-231

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ටැන්රා ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2007 අගෝස්තු මස 07
සමාගමේ අංකය : පී. වී. 60935
ලියාපදිංචි කාර්යාලය : අංක 170/1, කුරුණෑගල පාර, රඹුක්කන.

සේන හේමේන්ද්‍ර ප්‍රේමරත්න,
සමාගමේ ලේකම්.

09-216

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : රුහුණු ඕගනික් ෆුඩ් ප්‍රොඩක්ට්ස් කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පීවී 60957

සංස්ථාගත කරන ලද දිනය : 2007 අගෝස්තු මස 09 වැනි දින

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : දලුක්වංගුව, රත්නපුර පාර, නෝනාගම, අම්බලන්තොට

සමාගම් ලේකම්.

09-214

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ ටී. ටී. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 16 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ටී. ටී. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 61055
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 316, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතුව,

එච්. ඩී. සී. ඩී. විජේසිංහ,
ලියාපදිංචි ලේකම්වරිය.

09-232

---

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## 2008 වර්ෂය සඳහා රට බීම තැබෑරුම් රේන්ද විකිණීම - කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2008 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(i) 1982.08.20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පෙනෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,
(ii) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන "එෆ්" තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතිකය නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන්වීමට පෙර, වත්කම් සහතික වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ "2008 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක................ දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය"යි යන්න සඳහන් ටෙන්ඩර් පත්‍ර, තැබෑරුමේ නමට කෙළින් පහත දක්වා තිබෙන වේලාවන් සහ දිනයන්හි දී ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසන් වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුයි.

04. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ඔහුගේ ම නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

07. 2007 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එකී ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :

## උපලේඛනය

| *(අ)* *අනුක්‍රමික අංක* | *(ආ)* *කොට්ඨාසය* | *(ඇ)* *ප්‍රාදේශික බල ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* | *(ඈ)* *තැබෑරුම විවෘත කරන වේලාව* | *(ඉ)* *තැබෑරුම වසන වේලාව* | *(ඊ)* *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු.* | *(උ)* *ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව* | *(ඌ)* *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 13 කොට්ඨාසය කොටුව | (අ) ක්වීන් වීදියේ සහ යෝක් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ බේලි වීදිය පෙදස<br>(ආ) කැනල් රෝ සහ චර්ච් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ යෝක් වීදියේ බටහිර පෙදෙස<br>(ඇ) යෝක් වීදියේ සහ ජ්ලැග්ස්ටාප් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ චැතැම් වීදියේ දෙපස පෙදෙස, චර්ච් වීදියේ සහ චැතැම් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ ක්වීන් වීදියේ නැගෙනහිර පෙදෙස | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2007.09.21 |
| 2. | අංක 2 කොට්ඨාසය මෝදර | *පෙදෙස මෙසේ සීමා වී තිබේ:–* උතුරට : අලුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ද, නැගෙනහිරට : පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට අලුත් මාවත පාරේ බටහිර පෙදෙස ද, දකුණට : ශාන්ත ඇන්ඩෲගේ පාරේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ උතුරු පෙදෙස ද, බටහිර මාලේ වීදියේ සහ පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ශාන්ත ඇන්ඩෲ පාරේ නැගෙනහිර පෙදෙස සහ මාදම්පිටිය හා මාලේ වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ මෝදර වීදිය නැගෙනහිර පෙදෙසත් ය | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2007.09.21 |

09. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

10. *වැදගත්*.– 2007.09.21 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2007.10.19 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

එම්. ජේ. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2007 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-146/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව - කොග්ගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වදුරඹ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ කීඹිය ගමේ කොහිලහේන වතුර පාරට මායිම්ව පිහිටි පන්නමග ගෘප් නැමැති ඉඩමෙන් බෙදු කොටසක් හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩම් ප්‍රමාණය - අක්කර -01 පර්චස් 25යි.

මෙම දේපල, තල්ගම්පොල, පිටදෙණිය අංක 55 හි පිලාන ගොඩකන්දගේ සිරිපාල යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2000.09.15 වැනි දින රජයේ *ගැසට් පත්‍රය*, 2000.05.09 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– ගාලු නගරයේ සිට උඩුගම මාර්ගයේ ජයන්ති හන්දිය දක්වා කිලෝමීටර් 9ක් පමණ ගමන්කර වම් දෙසට හැරී ඔවිලාන පාරේ කිලෝමීටර් 1.4ක් පමණ පිටදෙණිය හන්දිය දක්වා පැමිණ වමට හැරී කොහිලහේන වතු පාරේ මීටර් 200ක් පමණ ගමන්කල විට මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීම ක්‍රමය* .–විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරු ගේ කොමිස් මුදල 2.5% (සියයට දෙකහමාරක්)නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනුවක්) විකිණීමේ දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (දේපල අංශය) සීමාසහිත සෙලාන් බැංකුව සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456284 - 5, 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර
දුරකථන අංක: 081-2211025, 071-4755974, ෆැක්ස් අංකය :081-2211025

09-182/1

## සීමාසහිත සෙලාන් බැංකුව - දෙහිවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට ඉතා වටිනා දේපලක්

මොරටුව නගර සභා සීමාවන් තුළ මොරටුව ගමේ කල්දේමුල්ල දහම් මාවතේ ගාලු පාරට මීටර් 500ක් පමණ නුදුරුව පිහිටි "කෝවිලවත්ත" නැමැති ඉඩමෙන් බෙදු කොටසක් හා එහි පිහිටි සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 06යි.

දෙහිවල ලියාපදිංචි " දිමුතු එන්ටර්ප්‍රයිසස් " යන නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පොන්නයි දලාගේ මාලනී පුෂ්පලතා යන නමින් ද හඳුන්වනු ලබන පොන්නයි දලාගේ මාලනී පුෂ්පලතා ප්‍රනාන්දු සහ දීපාන් සමන් වර්ණපුර යන අය බන්ධනදායීන් ලෙස සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇති දේපල 2007 ක් වූ සැත්තැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10.30 එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.07.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2007.06.15 වැනි දින ලංකාදීප, ඩේලිමිරර් සහ 2007.06.26 වැනි දින වීරකේසරී යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්, ) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරු ගේ කොමිස් මුදල 2.5% (සියයට දෙකහමාරක්)නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනුවක්) විකිණීමේ දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (දේපල අංශය) සීමාසහිත සෙලනේ බැංකුව සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456258 077-7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.
අංක 83/5, බෝමලුව පාර, වටපුළුව, මහනුවර
දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497,
071-2755974
ෆැක්ස් අංකය :081-2211025

09-182/2

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මොණරාගල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ ද 1998.11.11 දින සහ අංක 6295 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගීගන ගමගේ සුසිල් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේදී 2007 සැප්තැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ බුත්තල වැදිරට කෝරළේ මුප්පන පිහිටි බකිණිකොටේ වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩබ්. ඩබ්. සිල්වා විසින් මැන සාදන ලද 1992.08.04 දිනැති අංක 420 දරන පිඹුර ප්‍රකාර ලොට් 01 බී දරන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

විශාලත්වය පර්චස් 30 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.15 දින *රජයේ ගැසට්* පත්‍රය සහ 2007.06.25 වන දිනැති අයිලන්ඩ්, දිවයින, පුවත්පත් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

01. ගැණුම් මිළෙන් සියයට දහය (10%)ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%)ක් ද,
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
05. සියලුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහ (රු. 2,000)ක් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්)

දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ 12.

09-201

## මහජන බැංකුව – ලකී ප්ලාසා ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහා පළාත කෝරළේ තැබිල්ලවෙල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්. 01 රූඩ් 02 පර්. 17ක් විශාල ඉඩම මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත 2007 ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින ප. ව. 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* 2007.08.08 දිනද, 2007.07.19 වැනි දින පුවත්පත් වල ද, පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.–* බණ්ඩාරවෙල මධ්‍යම බස් නැවතුම්පලේ සිට බිඳුනු වැව පාරේ මීටර් 500ක් පමණ ගිය විට වම් පසින් ඇති විශාඛා මාවතේ මීටර් 300ක් පමණ ගියවිට පාරෙන් වම් පස දියමන්ති කැපුම් කර්මාන්ත ශාලාව පිහිටි දේපල.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත කොළඹ 01, අංක 11, ආදිපාද විදියේ මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර I) වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 2393678, 2387028, ෆැක්ස් අංක 2435977, හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින තිහක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
තක්සේරුකරු සහ බ්‍රෝකර්.
මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකරු.

කාර්යාලය අංක : 25 සී,
බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356
*"නිවස "*
අංක 11/55, කුඩා බුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 011-2419126.

09-242

## මහජන බැංකුව – මූලස්ථාන ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පදිංචියට සුදුසු නිවාසමය දේපලක්

මත්තේගොඩ ගම පිහිටි මත්තේගොඩ වත්ත නැමැති ඉඩමෙන් පර්චස් විසි එකයි දශම හයයි හයක් (අ. 0 රූ. 0 පර්. 21.66) විශාල ඉඩම සහ නිවස.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.09.28 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා.– *රජයේ ගැසට් පත්‍රයේ* 2007.04.12 වැනි දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2007.04.03 වැනි දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– කොළඹ සිට කොට්ටාව නගරයට ගොස් එතැනින් දකුණට ඇති පාරේ කි. මී. 2ක් පමණ ගිය විට මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමය හමුවේ. එම නිවාස යෝජනා ක්‍රමය බස් නැවතුම් පල පසුකර මීටර් 100 පමණ ඉදිරියට යන විට දකුණු පසට ඊගල් නිවාස පාර හමුවේ. එම පාරේ දකුණු පස 2 වැනි නිවස වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත කොළඹ 01, ආදිපාද විදියේ මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර I) වෙත ගෙවිය යුතුය. දුරකථන අංක 2393678, 2387068, ෆැක්ස් අංක 2435977, හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින තිහක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
තක්සේරුකරු මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකරු.

ලිපිනය : කාර්යාලය
අංක 25 සී,
බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-5756356.
නිවස :
අංක 11/55, කුඩා බුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 011-2419126.

09-237

## මහජන බැංකුව – ලකි ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

දියමන්ති සමාගමේ යන්ත්‍රෝපකරණ පහත සඳහන් පරිදි වේ :

උකස් කරන ලද යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තරය

| *අංකය* | *සංකේත අංකය* | *අයිතමය* | *යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව* |
|---|---|---|---|
| 1. | B/D/C/MI TO 50 | දියමන්ති කපන මැෂින් සම්පූර්ණ කට්ටලය | 50 |
| 2. | B/O/D/MI TO 2 | O/D මැෂින් | 2 |
| 3. | B/D/BM/1 M 16 | බෲටින් මැෂින් විද්‍යුත් සහිත | 16 |
| 4. | B/D/M/M | යන්ත්‍රෝපකරණ නඩත්තු සම්පූර්ණ කට්ටලය<br>ස්කෝරිං මැෂින් 1<br>රබින් මැෂින් 1<br>පොසිෂනිං මැෂින් 1<br>බැලන්සිං මැෂින් 1<br>ලේත් මැෂින් 1 | කට්ටල 1යි |
| 5. | B/D/M/P 1-1 | වෙල්ඩින් යන්ත්‍රය 190 ඒම්ප් (ටෙල්වින්) | 1 |
| 6 | B/D/T/E | ටැන්ග්ස් එක්ස්ට්‍රා | 39 |
| 7 | B/D/T/L 1-7 | මේස ලාම්පුව (ඩේසර්) | 7 |
| 8 | B/D/S/T | සීවිස් ටර්බෝ (පාවිච්චිකළ) | 11 |
| 9 | B/D/S/D 1-16 | සීවිස් - ඩයමන්ඩ් (පාවිච්චි කළ) | 16 |
| 10 | B/D/S/D 1-16 | සිවිස් ඩයමන්ඩ් (අලුත්) | 34 |
| 11 | B/D/B/P 1-1 | උණුකරණ යන්ත්‍රය | 01 |
| 12 | B/D/JA 1-2 | ජැක් | 02 |
| 13 | B/DSC 1-1 | තරාදි (සැටොරියස්) 1500 cts. | 1 |
| 14 | B/D/SC 1-2 | තරාදි (සැටෝරියස්) 1500 cts. | 2 |

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 15 | B/DSC 1-1 | තරාදි (ඒඑම්ඩී) 1500 cts. | 1 |
| 16 | B/D/P/S 1-1 | පොලිතින් ඇවුරුම් උපකරණ | 1 |

ඩයමන්ඩ් උපකරණ තක්සේරුව

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | B/L/F/M 1-147 | ෆැෂටින් යන්ත්‍රය (බඩල් හැන්ඩ්) | 147 |
| 2 | B/L/F/M 1-46 | ෆැෂටින් මැෂින් (තනි) | 46 |
| 3. | B/L/F/M 1-20 | ෆැෂටින් මැෂින් (තනි Fac 8) | 20 |
| 4 | B/L/F/M 1-37 | ෆැෂටින් මැෂින් (ඩබල්) | 37 |
| 5 | B/L/C/M 1-1 | ෆැෂටින් මැෂින් (ඩබල් 10-කී) | 01 |
| 6 | B/L/C/M 1-3 | ක්‍රමාංකන යන්ත්‍රය (අතින් වැඩකරන) | 03 |
| 7 | B/L/C/M 1-7 | කැලිබ්‍රේෂන් මැෂින් | 07 |
| 8 | B/L/C/M 1-5 | කැලිබ්‍රේෂන් මැෂින් (අර්ධක ස්වයංක්‍රීය) | 05 |
| 9 | B/L/G/M 1-2 | ඇඹරුම් යන්ත්‍රය | 02 |
| 10 | B/L/S/M 1-14 | මහන මැෂිම | 14 |
| 11 | B/L/S/H/M 1-2 | මහන මැෂිම (ද්විත්ව) | 02 |
| 12 | B/L/T/U/M | ටම්බ්ලින් මැෂිම | 01 |
| 13 | B/L/P/M 1-7 | පර්පෝමින් මැෂින් (ද්විත්ව) | 07 |
| 14 | B/TR/ST 1-2 | ස්ටොප්සෝන් ට්‍රාන්පෝර්මර් | 02 |
| 15 | B/F/EX | 1. ශුන්‍ය කාරක විදුලි පංකා 18"<br>2. ශුන්‍ය කාරක විදුලි පංකා 12"<br>3. ශුන්‍ය කාරක විදුලි පංකා එම | 01<br>01<br>01 |
| 16 | B/B/G 1-4 | ගෑස් ලිප (බර්නර් ) | 06 |
| 17 | B/P/A 1-4 | වායු දවනය | 04 |
| 18 | B/M/E1-12 | විදුලි මෝටරය 1/2 H. P. | 12 |
| 19 | B/M/E/CA 1-2 | ක්‍රමාංකන යන්ත්‍ර මෝටරය 1/2 H.P | 02 |
| 20 | B/F/S/M 1-2 | සීලින් ෆෑන් මෝටරය | 02 |
| 21 | B/B/V 1-1 | බෙන්ච් වයිස් | 01 |
| 22 | B/D/B 1-164000 | පිත්තල ඩොප් ස්ටික් මි. මී. 8 | 164,000 |
| 23 | B/D/A 1-3200 | ඇලුමිනියම් ඩොප් ස්ටික් | 3200 |
| 24 | B/CA/D1 1-2 | ඇල්ෆා විද් තරාදිය ග්‍රෑම් 500 | 2 |
| 25 | B/CA/DIA 1-2 | ඩිජිටල් කැලිපර් | 2 |
| 26 | B/CA/DIA 1-8 | ඩයල් කැලිපර් | 8 |
| 27 | B/T/W | දැව මැෂින් මේසය<br>1. 13' x 4' (5 x 2)<br>2. 7' x 2' (3 x 1)<br>3. 45' x 2' (2x1)<br>4. 12' x 14' (4x 2)<br>5. 3' x 3'<br>6. 2' x 3' | <br>1<br>1<br>1<br>1<br>1<br>1 |
| 28 | BT/M/FO 1-2 | මැෂින් මේසය ෆොමිකා මතුපිට | 2 |
| 29 | B/B/W 1-10 | දැව බංකු 25 x 1.5 | 10 |
| 30 | B/CU/W | දැව කබඩ්<br>1. 3' x 4.5' x 1.5<br>2. 4' x 4' 1.5<br>3. 3' x 4' 1.5 | <br>01<br>01<br>03 |
| 31 | B/T/DO 1-1 | ඩොපින් මේසය 2.5' **x** 3' | 01 |
| 32 | B/T/CI 1-2 | ලිපිකරු මේස | 02 |
| 33 | B/D/RA 1-1 | ඩොප් ස්ටික් පැක් 5' x 4. 5' | 01 |

| අංකය | සංකේත අංකය | අයිතමය | යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 34 | B/T/1 1-1 | පරීක්ෂණ මේසය 3' x 3' | 01 |
| 35 | B/CH/W/CA 1-4 | දැව සහිත වේවැල් පුටුව | 04 |
| 36 | B/CH/W1-3 | දැව පුටුව | 03 |
| 37 | B/D/WCJ 1-1 | දැව ලාච්චු කබඩ් එක 2.75' x 3 x 1.25' | 01 |
| 38 | B/CA/F1 1-1 | ලිපිගොණු කැබිනට්ටුව (වානේ) | 01 |
| 39 | B/SA/IR -1 | යකඩ සේප්පුව 4' x 2' x 2.25" | 01 |
| 40 | B/F/SE 1-72 | සීලිං විදුලි පංකාව | 72 |
| 41. | B/F/T 1-4 | මේස විදුලි පංකාව | 04 |
| 42 | B/F/PD 1-1 | පෙඩස්ටල් විදුලි පංකාව | 01 |
| 43 | B/T/L | ටියුබ් ලයිට් පිටින් | |
| | | 1. අඩි 2යි | 21 |
| | | 2. අඩි 4යි | 13 |
| 44 | B/CY/G 1-4 | ගෑස් සිලින්ඩරය | 04 |
| 45 | B/G/H 1-1 | අතින් වැඩ කරන ඇඹරුම් යන්ත්‍රය | 01 |
| 46 | B/L/T 1-3 | මේස ලාම්පුව | 02 |
| 47 | B/ST/W 1-40 | දැව ආයුධ | 40 |
| | | ලැපිඩරි යන්ත්‍ර තක්සේරුව | |

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින පෙ. ව. 11.00 ට දියමන්ති සමාගම් පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2007.08.08 දින රජයේ ගැසට් පත්‍රයේ ද 2007.07.19 වැනි දින පුවත්පත් වල ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය.–* බණ්ඩාරවෙල මධ්‍යම බස් නැවතුම් පලේ සිට බිඳුනු වැව පාරේ මීටර් 500ක් පමණ ගියවිට වම් පසින් ඇති විශාඛා මාවතේ මීටර් 300ක් පමණ ගිය විට පාරෙන් වම් පස පිහිටි දියමන්ති කැපුම් කර්මාන්ත ශාලා දේපළහි මෙම යන්ත්‍රෝපකරණ ඇත.

*ගෙවීමේ ක්‍රමය.–*

1. භාණ්ඩ මිළදී ගත් පසු භාණ්ඩවල සම්පූර්ණ මුදල් ගෙවිය යුතුය,
2. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් 2 1/2%ක් ගෙවිය යුතුය,
3. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වෙතොත් එම මුදල,
4. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
5. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

*භාණ්ඩ පිළිබඳ අදාල විස්තර.–* කොළඹ 01, අංක 11, ආදිපාද විදියේ බටහිර කලාප 1 හි සහකාර සමාන්‍යාධිකාර මහතාගෙන් විමසන්න.

දුරකථනය : 2393678, 2387028,
ෆැක්ස් අංකය : 2435977.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
තක්සේරුකරු සහ බ්‍රෝකර් මුළු දිවයිනටම
සමාදාන විනිශ්චයකරු.

*කාර්යාලය :*
අංක 25 සී,
බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංකය 011-5756356.

*නිවස :*
අංක 11/55, කුඩා බුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංකය 011-2419126.

09-236

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහ පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි ÷

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය" පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව රු. | ශ. | තැපැල් (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| සැප්තැම්බර් | 2007.09.07 | සිකුරාදා | 2007.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.14 | සිකුරාදා | 2007.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.21 | සිකුරාදා | 2007.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.28 | සිකුරාදා | 2007.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2007.10.05 | සිකුරාදා | 2007.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.12 | සිකුරාදා | 2007.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.19 | සිකුරාදා | 2007.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.10.26 | සිකුරාදා | 2007.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2007.11.02 | සිකුරාදා | 2007.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.09 | සිකුරාදා | 2007.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.16 | සිකුරාදා | 2007.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.23 | සිකුරාදා | 2007.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.11.30 | සිකුරාදා | 2007.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.